ගමන හරිම ලොකු අද්දැකීමක් වෙයි..” අජන්ත කීවේය..

අමන්දි සතුටින් සිනාසුණා ය. ඒ යෝජනාව ඇගේ සිතෙහි උනන්දුවක් ඇති කරන්නට සමත් එකකි.

000

අතු අග මල් පොහොට්ටු පිබිදෙමින් තිබෙයි. ළඳල්ලෙන් වැසී ගත් තුරු පෙළ මඳ නළ හා ලතාවකට නැළැවෙයි. දූවිල්ලෙන් අපවිත්‍ර නොවූ නැවුම් සුළඟින් පෙනහළු පිරෙන්නට හුස්මක් ඇදගත් විශ්වජිත් වාඩි වී සිටි බංකුවෙන් නැගිට්ටේ ය. මේ දැනෙන නිස්කලංක බව නිදහස සැමදා විඳගන්නට ඇත්නම් යයි වරෙක ඔහුට සිතෙයි. මෙවන් නිවාඩුවක් ලබා ගන්නට ඔහු කාලාන්තරයක් තිස්සේ පෙරුම් පිරුවේය. විශ්ව සංසදයේ සමුළුව අවසාන වූ සැණින් ලංකාවට නොගොස් දින කීපයක් පැරිසියේ රැඳෙන්නට ඔහු තීරණය කළේ එනිසා ය.

නැවත මව්බිම බලා යන්නට ඇත්තේ දින තුනක් පමණක් බව සිහිපත් වන විට විශ්වජිත් ගේ සිතෙහි ඇතිවන්නේ කණගාටුවකි. මේ අතරවාරයේ ඔහු මුම්මාත්හි කලාකරු-වන්ගේ අපූරු කලා නිර්මාණ දැක ගන්නට කී වතාවක් නම් ආවාදැයි ඔහුම නොදනියි. විවේකයක් ලද ඇසිල්ලෙන් ඔහු මුම්මාත් නැමැති මෙම ලෝක ප්‍රකට ස්ථානය කරා දුව එන්නේ අසපුවක් බලා යන තවුසෙකු සේ ය.

ඔහු මේ පරිසරයේ දී දැහැන් ගත වෙයි. ඊසල මත රඳවාගත් කැන්වස් තිර මත ජීවිත නිර්මාණය කරන මේ අති දක්ෂ සිත්තරුන්ගේ පින්සල් හරහා තම ජීවිතයේ දර්ශනීයම පින්තූර පෙළ අඳින්නට විශ්වජිත් වෙහෙසෙයි. කාලය ගෙවී යනවා ඔහුට නොදැනෙයි. අහම්බෙන් කෙනෙකුගේ කතාබහකට හෝ පුංචි දරුවෙකුගේ හැඬීමකින් හෝ වෙනයම් විශේෂිත බාධාවකින් හෝ



ඔහුගේ සමාධිය නොබිඳේ නම් වරු ගණනක් ඔහු මුම්මාත් හි ගත කර බොහෝ හවස් වී නැවත තම හිතවතා ගේ නිවසට පැමිණෙයි.

බොකුටු රැවුලක් ඇති වයස්ගත චිත්‍ර ශිල්පියා විශ්වජිත් ගේ සිතේ ඇති කළේ විස්මයකි. අනෙකුත් සිත්තරුන් අතරින් ඔහු කැපී පෙනුණේ මන්දැයි ඔහුටම සිතා ගත නොහැකිය. මේ වයස්ගත මිනිසා අඳින සෑම පැන්සල් පහරක්ම මහා දිග කතාවක් සේ විශ්වජිත්ට දැනෙයි. ඒ රේඛා ප්‍රහල ය. ශක්තිමත් ය. මට සිළුටු ය. නම්‍යශීලී ය. මේ සියල්ල එක් රැස් වුණ විස්මිත නිර්මාණය දෙස විශ්වජිත් දැහැන්ගතව බලා සිටියි.

කුඩා දරුවකු ගේ කට හඬ ඈතින් ඇසෙයි. විශ්වජිත් මොහොතකට දැහැනින් මිදී එදෙස බලයි. මුම්මාත් හි සුප්‍රකට සක්‍රික නම් වන පල්ලියේ සිට කලාකරුවන් සිටින පෙදෙසට ඇවිද එන පිරිස ඔහුට පෙනෙයි. එක මො-හොතකට විශ්වජිත් ගේ සිත සසැලෙයි. අමන්දි..? මේ ඇය නොවේ ද..? පෙර දිනෙක තමාගේ කලා ගාරයට

පැමිණ චිත්‍ර ශිල්පය උගන්වන්නැයි තමාගෙන් ඇයැද සිටියේ ඇය නොවේ ද? තමාගේ අකරුණාවන්ත ප්‍රතික්ෂේප කිරීමෙන් පසු කඳුලු පුරවා ගත් දෙනෙතින් බලා සිට පිටව ගියේ ඇය නොවේ ද? ඒ බැල්මෙන් තමාගේ සිත සසළ කළේ ඇය නොවේ ද.?

නන්නාඳුනනා දේශයක දී නැවතත් ඇය මෙලෙස දකින්නට ලැබීම කෙතරම් අරුමයක්ද??

අමන්දි අසළින් යන්නේ ඇගේ සැමියා විය යුතුය. හිතවතෙකු වන්නටද පුළුවන. සිනාවකින් සැරසී සිටිය ද මේ සුන්දර තරුණියගේ මුහුණේ සැඟවී ඇත්තේ කිසියම් වේදනාවක් නොවේ ද? එදා ඇය හමුවූ මොහොතේත් ඒ පැනයම තම සිත තුළ මතුවූ බව විශ්වජිත්ට සිහිපත් විය. ඇගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමෙන් තමා කළේ බරපතළ වරදක් යයි පළමු වරට ඔහුට සිතුණි. සසල වූ සිතින් යුතුව විශ්වජිත් බලා සිටියේ ය. ජීවිතය කොයි තරම් විශ්මයජනක දේ සිදු කරන්නේදැයි ඒ අතර ඔහුට සිතෙයි.

අමන්දි වෙත ගොස් කතා කරන්නට ඇති වූ සිත වසන් කර ගනිමින් විශ්වජිත් ගල් පිළිමයක් සේ ඔවුන් දෙස ම බලා සිටියේ ය.

0000000000

වේදනා නාශක පෙති කීපයක් එකවර ගිල දැමූ අමන්දි ඇඳේ වාඩි වී අන්ධකාරය දෙස බලා සිටියා ය. නිමන්ත ඇහැරුණේ ඇගේ කෙඳිරිලි හඬට ය.

“අමාරුද..?” ඔහු ඇසුවේ ය.

ඔහුගේ අනුකම්පා සහගත ප්‍රශ්න කිරීම පවා කරදරයකි. අමන්දි පිළිතුරක් නොදී ඇඳේ ඇලවෙයි.

නිමන්ත ඇඳෙන් නැගට විදුලි පහන දැල්වූයේ ය.

“දවල් ඇවිදලා ඔයාට මහන්සි ඇති.. ” ඔහු ඈ අසළින් වාඩි වී ඇගේ හිසට අත තැබුවේ ය. “ .. ඇඟ රස්නෙයි..”

ඈ අප්‍රසාදයෙන් උරහිස ගැස්සුවා ය.

“ලයිට් එක නිවන්න..” ඇගේ කටහඬ විධානයක් සේ විය. ඔහු කතාවකින් තොරව නැගිට ගොස් විදුලි පහන නිවා දැමුවේ ය.

“.. ඔයා නිදාගන්න..” ඇගේ කටහඬ ඒ අතර ඔහුට ඇසුණි. “.. මම නින්ද යන පෙත්තක් බිව්වා.. තව ටික වෙලාවක් යනකොට මට නින්ද යයි..”

අඳුරේ ම ඇඳේ වැතිරගත් ඔහු ඇගේ කෙඳිරිලි හඬට සවන් යොමා සිටියේ ය. දහවල මුම්මාත් හිදී ඈ කොයි තරම් සැහැල්ලුවෙන් හා සතුටින් සිටියා ද? විවිධ සිත්තරුන් අසළ නැවතෙමින් ඔවුන් අතින් ඇඳෙමින් තිබුණ සිත්තම් නිරීක්ෂණය කරමින් ඈ බොහෝ වේලාවක් ගත කළ හැටි ඔහුට සිහිපත් විය. කොයි තරම් උනන්දුවකින් හා උද්‍යෝගයකින් ඈ ඒ නිර්මාණ රස වින්දාද?

“මේ චිත්‍ර දකිනකොට මට ලෝබයි නිමන්ත.. ඇත්තටම ලෝබයි.. මේ විදිහට අඳින්න කොයි තරම් හැකියාවක් ප්‍රතිභාවක් තියෙන්න ඕනෙද කියල හිතනකොට මට පුදුමයි..” ඈ කී සැටි ඔහුට මතකය.

“.. අපේ රටේ ශිල්පින් ගත්තම කීයෙන් කී දෙනෙකුටද මේ වගේ හැකියාවක් තියෙන්නෙ..?” නිමන්ත කීවේ ය.

“නෑ නිමන්ත.. එහෙම කියන එක වැරදියි.. අපේ රටේ ඉන්නවා ගොඩක් දක්ෂ අය.. ගොඩක් දක්ෂ අය.. ඒ අය හැංගිලා ඉන්නෙ.. ඉස්සරහට එන්න අවකාශයක් නැහැ.. ක්‍රමයක් නැහැ.. පසුබිමක් නැහැ..”

“ඒක නම් ඇත්ත.. දැන් මේ ඔයා ඉන්නවා.. කීයෙන් කී දෙනාද දන්නෙ ඔයාට ලස්සනට අඳින්න පුලුවන් කියලා.. උඹල දන්නෙත් නෑ නේද..? ඇත්තටම කිව්වොත් අජන්ත මං විතරයිද කොහෙද ඒක දන්නෙ..” ඔහු කවට කම් කළේ ය. ඈ කුඩා දරුවකු ලෙස සිනාසුණා ය.

“මට හිනාවෙනවා නේද..? මං කොහොම හරි දවසක මේ වගේම ලස්සනට අඳින්න පුරුදු වෙනවා.. එදාටත් හිනාවෙන්නකො..” ඈ කී සැටි තවමත් ඔහුට මතකය.

ඔහු සුසුමක් හෙලුවේ ය. අමන්දි නින්දට වැටී ඇති බව ඔහුට දැනෙයි. නින්දේදී පවා ඈ සිහින් හඬින් කෙඳිරිගායි. ඈ කෙරෙහි ඇති වූ අප්‍රමාණ අනුකම්පාවකින් ඔහු සිත පිරී යයි.

“අහිංසක කෙල්ල..” ඔහු ඉතා සීරුවෙන් ඇගේ හිස මත තම අත තබයි. “..ඔයා මට නැතිවෙයිද අමා..?” ඔහු තමාගෙන්ම අසා ගත්තේ ය.







ලබන කලාපයට

